# ප්‍රසම්පාදන දැන්වීම

## යුද්ධ හමුදා රෙදිපිළි පිරිසිදු කිරීම - 2019

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

1. 2019.01.01 දින සිට 2019.12.31 දින දක්වා වු කාලය තුළ පහත සඳහන් ප්‍රදේශයන්හි ඇති යුද්ධ හමුදා කඳවුරු වල බැරැක්ක සහ ආරෝග්‍යශාලා රෙදිපිළි සහ යුද්ධ හමුදා තූර්ය වාදක ඇඳුම් ආයිත්තම් පිරිසිදු කිරීම පිණිස කොළඹ 03, තැ:පෙ: 553, බාලදක්ෂ මාවතේ පිහිටි ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානයේ ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් ප්‍රසම්පාදන කැඳවනු ලැබේ. ප්‍රසම්පාදන අයදුම්පත් නිකුත් කරන අවසන් දිනය හා වේලාව 2018 සැප්තැම්බර් මස 10 දින 1000 පැයට වන අතර, ප්‍රසම්පාදන අයදුම්පත් 2018 සැප්තැම්බර් මස 11 දින 1000 පැය දක්වා භාරගෙන විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේදී ප්‍රසම්පාදනකරු හෝ ප්‍රසම්පාදනකරුගේ අනුමත නියෝජිතයෙකු හට සහභාගි විය හැක.

### සැපයීම් ප්‍රදේශ

### යුද්ධ හමුදා බැරැක්ක රෙදිපිළි පිරිසිදු කිරීමේ ප්‍රදේශ

| | | | |
|---|---|---|---|
| අල්ලකන්තලේ | කුරුණෑගල | පුනරින් | යාලපලටුපාන |
| අක්කරෙයිපත්තුව | කොළඹ | පොල්හේන්ගොඩ | රොක්හවුස් |
| ඇඹිලිපිටිය | කොස්ගම | පුත්තලම | ලක්ෂපාන |
| අඹේපුස්ස | කෝපායි | බුත්තල | වාකරේ |
| ඉරණමඩු | කොහොඹගස්හන්දිය | බටලන්ද | වැල්ලවාය |
| ඉනාමළුව | කොත්මලේ | බලල්ල | වැලිකන්ද |
| උකුවෙල | ගන්නෝරුව | බදුල්ල | විශ්වමඩු |
| උඩවලව | ගනේමුල්ල | බූස්ස | වීරවිල |
| ක්ලැපන්බර්ග් | ගිරිතලේ | බූ ඔය | වේයන්ගොඩ |
| කල්ලාර් | තලාව | බොරැල්ල | වෙත්තලකේණි |
| කටුනායක | තිසාවැව | මඩකලපුව | සාලියපුර |
| කෑගල්ල | තබ්බෝව | මහනුවර | සුංගාවිල |
| කලත්තෑව | තුනුක්කායි | මල්වත්ත | සේනපුර |
| කලාඔය | දෙහිඅත්තකණ්ඩිය | මයුරපුර (නාගර්වැව) | හබරණ |
| කතරගම | නාවුල | මිරුසුවිල් | |
| කටුබැද්ද | නුවරඑළිය | මිහින්තලය | |
| කුරුවිට | පල්ලෙකැලේ | මැදවච්චිය | |
| කුකුලේගඟ | ජයන්තිගම | මොරවැව | |

### යුද්ධ හමුදා බැරැක්ක සහ ආරෝග්‍යශාලා කිළිටි රෙදිපිළි පිරිසිදු කිරීමේ ප්‍රදේශ

| | | | |
|---|---|---|---|
| අනුරාධපුරය | කිලිනොච්චිය | පලාලි | මින්නේරිය |
| අම්පාර | කොක්එළිය | පුනානි | රාගම |
| අකුරුස්ස | ගජසිංහපුර | පුදුකුඩුඉරුප්පු | වව්නියාව |
| ඔඩ්ඩුසුඩාන් | ත්‍රිකුණාමලය | මන්නාරම | වැලිඔය |
| කැලණිය | දියතලාව | මාදුරුඔය | වෙල්ලම්කුලම්(වව්) |
| මුලතිව් | පනාගොඩ | | |

### බැරැක්ක/රෝහල් කිළිටි රෙදිපිළි සහ යුද්ධ හමුදා තුවාක ඇඳුම් ආයිත්තම් පිරිසිදු කිරීමේ ප්‍රදේශ

රත්මලාන

2. ඒ ඒ කඳවුරු යටතේ විවිධ වූ රෙදිපිළි වර්ග යටතේ ඉදිරිපත් කරනු ලබන මිල ගණන් එකට එක්කොට ( මිල කාණ්ඩයෙන් මිල කාණ්ඩය වෙන් වෙන්ව) ඇගයීම් සඳහා ඉදිරිපත් කෙරෙනු ඇත.

3. අයදුම්කරුවන් වෙතින් ප්‍රසම්පාදන මිල ගණන් සමග පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

අ. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය (සහතික කරන ලද ඡායාස්ථ පිටපතක්)

ආ. ඉල්ලුම්කරු විසින් පවත්වාගෙන යන බැංකු ගිණුමකට අදාළ බැංකු ප්‍රකාශය

ඇ. රජක සේවාව ඉටුකරනු ලබන බැව් සනාථ කිරීම සඳහා පිළිගත හැකි සහතික ඉදිරිපත් කළ යුතුය.

ඈ. ප්‍රසම්පාදන ලියකියවිලි ලබාගැනීමේදී කොන්ත්‍රාත්කරු විසින් රජයේ හෝ රජයට සම්බන්ධ කිසිදු රැකියාවක් නොකරන බවට තහවුරු කරමින් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරනු ලබන සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

ඉ. වත්කම් සහ මුදල් ස්ථාවරත්වය සනාථ කරනු වස් පළාතේ දිසා ලේකම්/ප්‍රාදේශිය ලේකම් විසින් නියමිත ආකෘති පත්‍රය (පොදු 170) මගින් එක් එක් කඳවුරු සඳහා රු:50000.00 කට නොඅඩු වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ යුතු අතර, එම සහතිකය ප්‍රසම්පාදනය විවෘත කරන දිනට දින 30 ක් ඇතුළත ලබාගත් එකක් විය යුතුය.

ඊ. ප්‍රසම්පාදනකරුවන් වැට් බද්ද සඳහා ලියාපදිංචි වී සිටි නම් ඒය සනාථ කිරීම සඳහා 2018 ජූලි මසින් පසු දේශීය ආදායම් දෙපාර්තුමේන්තුවෙන් ලබාගත් ලිපියක් සහ වැට් බද්ද සඳහා ලියාපදිංචි නොවූ කොන්ත්‍රාත්කරුවන් තමන් වැට් බද්දෙන් නිදහස් බැව් සඳහන් කරමින් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙතින් 2018 ජූලි මසින් පසු ලබාගත් ලිපියක් ඉදිරිපත් කළ යුතු වේ.

4. ප්‍රසම්පාදන අයදුම්පත ලබාගැනීම සඳහා එක් එක් සැපයීම් කඳවුර වෙනුවෙන් ආපසු ගෙවනු ලබන රු: 5000.00 ක ප්‍රසම්පාදන තැන්පතු මුදලක් සහ ආපසු නොගෙවනු ලබන රු:1000.00 ක ප්‍රසම්පාදන ගාස්තුවක් අවිස්සාවේල්ල පාර, ඔරුගොඩවත්ත කඳවුරේ පිහිටි අධ්‍යක්ෂ - මුදල් වෙත තැන්පත් කළ යුතුය. (චෙක්පත් භාරගනු නොලැබේ) එම මුදල් තැන්පත් කිරීම වෙනුවෙන් නිකුත් කරන රිසිට්පත ඉදිරිපත් කිරීමෙන් පසු කොළඹ 03, ගාලු මුවදොර ටෙරසය, දකුණු පෙදෙස යුද්ධ හමුදා මුලස්ථානයෙහි සැපයීම් හා ප්‍රවාහන අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් ප්‍රසම්පාදන අයදුම්පත් ලබාගත හැක.

5. ප්‍රසම්පාදන බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ "**බැරක්ක සහ ආරෝග්‍යශාලා රෙදිපිළි පිරිසිදු කිරීම ශ්‍රී ලංකා යුද්ධ හමුදාව 2019 වසර**" යනුවෙන් සඳහන් කර මුද්‍රා තබන ලද ප්‍රසම්පාදන අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් **සභාපති යුද්ධ හමුදා ප්‍රසම්පාදන කමිටුව, උපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව, තැ:පෙ: 553, බාලදක්ෂ මාවත, කොළඹ 03** වෙත එවීමට හෝ **යුද්ධ හමුදා ගුවන් ටිකට්පත් අලෙවි මධ්‍යස්ථානය, පාසන් පාර, කොළඹ 02** යන ලිපිනයේ තබා ඇති දේශීය මිලදී ගැනීම් වලට අදාළ ප්‍රසම්පාදන බහාලන පෙට්ටිය තුළට, පැමිණ බහාලිය හැක.

6. අදාළ අවශ්‍යතාවන්ට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව වෙත ඕනෑම අයදුම්පතක් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය ඇත.

7. ඉල්ලුම්කරුවන් විසින් ප්‍රසම්පාදන අයදුම්පත් ඉල්ලා සිටිමේදී තම සේවා සැපයිමට අපේක්ෂා කරනු ලබන කඳවුර/කඳවුරු සඳහන් කර එම ආකෘතිපත් ඉල්ලුම් කළ යුතුය.

8. ප්‍රසම්පාදන පත්‍රිකා මුදල් ගෙවීමකින් තොරව කොළඹ 03, ගාලු මුවදොර ටෙරසය, දකුණු පෙදෙස, යුද්ධ හමුදා මුලස්ථානයේ, සැපයීම් හා ප්‍රවාහන අධ්‍යක්ෂ මණ්ඩලයේදී රජයේ වැඩ කරන වේලාවන් තුළදි පමණක් පරීක්ෂා කර බැලිය හැක.

9. මෙම ප්‍රසම්පාදන සම්බන්ධයෙන් වැඩි විස්තර කොළඹ 03, ගාලු මුවදොර ටෙරසය, දකුණු පෙදෙස යුද්ධ හමුදා මූලස්ථානයෙහි සැපයීම් හා ප්‍රවාහන අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් ලබාගත හැකිය.

දුරකථන අංක :- 011-2302569, 011-2302568

**යුද්ධ හමුදාධිපති**

ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය
තැ:පෙ: 553
බාලදක්ෂ මාවත
කොළඹ - 03